# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date } 2021 - 02 - 01


පැමිණිලි පාර්ශවය : බී. ශ්‍රියාවතී මිය,
1 ඒ/එෆ් 7/යූ 26, සිරිසර උයන,
බේස්ලයින් මාවත,
බොරැල්ල, කොළඹ 08.

වගඋත්තර පාර්ශවය : 01. අධ්‍යක්ෂ,
බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ග්‍රීන්පාත්, කොළඹ 10.

02. විදුහල්පති,
සංඝමිත්තා බාලිකා විද්‍යාලය,
කොළඹ 10.

<u>පැමිණිලි අංකය : HRC/3620/17</u>

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාරිය විසින් 2018.11.23 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තම දරුවා වන පී.එන්.එම්.බී ගෝමස් දරුවා වගඋත්තරකාර විද්‍යාලයේ 2017 වර්ෂයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා ආසන්නතා ගණය යටතේ (සී.ඔ 761) සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී ලකුණු 57 ක් උපයාගත් බවයි. අදාළ ගණය යටතේ පාසලට ඇතුළත් කරගැනීමේ කඩඉම් ලකුණු සීමාව වන්නේ ලකුණු 66 ක් වන අතර, ඡන්ද නාම ලේඛනය සඳහා තමා වෙත ලකුණු 30 ක් ලැබිය යුතු වුවද ලකුණු 18 ක් පමණක් ලබා දීම තුළින් තමා අගතියට පත්වූ බව සඳහන් කර ඇත. ඊට හේතු වූයේ තමාගේ නම ඡන්ද හිමි නාම ලේඛනයේ වසර 5 ක කාලයක් සටහන්ව නොමැතිවීම බවත්, නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සිදුකරන ලද 'නාගරික




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.

සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451

ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541 / 74

ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrc@gmail.com

දුරකථන / தொலைபேசி / Telephone } 94 -11- 2505580 / 81 / 82

ලේකම් / செயலாளர் / Secretary } 011-2505521

ක්ෂණික / துரித அழைப்பு / Hotline } 1996

වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

පුනර්ජීව ව්‍යාපෘතිය' යටතේ රාජ්‍ය ප්‍රතිපත්තිමය තීරණයක් මත 2012.04.27 දින තමන් පදිංචි නිවස සහ ඒ අවට සියළුම නිවෙස් කඩා ඉවත් කර නව නිවාස ව්‍යාපෘතියක් ආරම්භ කිරීම මත තමන් උපන්දා සිට පදිංචි වී සිටි නිවස අහිමි වූ බවත් එමගින් වසර 05 ක ඡන්ද නාම ලේඛනයේ තමාගේ නම ඇතුළත් නොවූ බවත් එබැවින් වසර 05ක පදිංචි කාලය තහවුරු කිරීමට නොහැකි වීම තුළින් තම දරුවාට කඩඉම් ලකුණු සීමාව කරා ප්‍රවිෂ්ඨ වීමට නොහැකි වූ බවත් දක්වා ඇත. ඒ අනුව තම දරුවාට පාසලේ කඩඉම් ලකුණු සීමාවට වඩා වැඩි ලකුණු ප්‍රමාණයක් ලැබීමේ අවස්ථාව ඉහත කී නාගරික සංවර්ධන අධිකාරියේ නව ව්‍යාපෘතිය හේතුවෙන් අහිමිවූ බවත්, එමගින් තම දරුවාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවත් පැමිණිල්ලෙන් සඳහන් කොට ඇත.

**වගඋත්තර පාර්ශවීය කරුණු ඉදිරිපත් කිරීම :-**

පැමිණිල්ලට අදාළව කරුණු ඉදිරිපත් කරමින් සංඝමිත්තා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය විසින් සඳහන් කර ඇත්තේ, මෙම පැමිණිලිකාරිය ආසන්නතා පදනම යටතේ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී ලකුණු 57 ක් උපයාගෙන ඇති අතර, පාසලට ඇතුළත් වීමේ අවම ලකුණු සීමාව ලකුණු 66 ක් බවත්, ඒ අනුව පැමිණිලිකාරිය පාසලට ඇතුළත් වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය උපයාගෙන නොමැති බැවින් පැමිණිලිකාරියගේ දරුවා පාසලට ඇතුළත් කර නොගත් බවත්ය. තවද මෙම පැමිණිලිකාරිය පොරොත්තු ලේඛනයේ 31 වන ස්ථානය හිමිකරගෙන ඇති බවද දන්වා ඇත.

එසේම පැමිණිලිකාරිය අභියාචනා ඉදිරිපත් කර ඇත්තේ, ප්‍රමාද වී නිසා අභියාචනා මණ්ඩලයට කැඳවීම නොකළ බවත්, පැමිණිලිකාරියට අභියාචනා ඉදිරිපත් කිරීමට තිබූ අවසන් දිනය වූයේ 2017.10.15 දින බවත්, එදිනට පෙර අභියාචනයක් ඉදිරිපත් කර නොමැති අතර, පසුව එනම් 2017.10.20 වන දින පැමිණිලිකාරිය විසින් යොමුකර ඇති අභියාචනය පාසලට ලැබී ඇති බවත් දන්වා ඇත. අභියාචනා ඉදිරිපත් කිරීමේ දිනට පසුව ලැබෙන අභියාචනා සලකා නොබලන බවද වගඋත්තර පාර්ශවය වැඩිදුරටත් සඳහන් කර ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණය :-**

දෙපාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ඉදිරිපත් කර ඇති ලිඛිත හා වාචික කරුණු සලකා බැලීමෙන් අනතුරුව පහත කරුණු අනාවරණය වී ඇත.

1. පැමිණිලිකාරිය ආසන්නතා පදනම මත ලකුණු 57 ක් උපයාගෙන ඇති අතර, අභියාචනා කමිටුව හමුවට ඉල්ලුම් කළත් කැඳවා නොමැත. පැමිණිලිකාරිය සිය අභියාචනය 2017.10.14 වන දින

එනම්, අභියාචනා භාරගැනීමට පෙර දින ලියාපදිංචි තැපෑලෙන් වගඋත්තරකාර විද්‍යාලය වෙත යොමු කර ඇති බව ලේඛන අනුව පැහැදිලි වේ.

2. 2012.04.27 වන දින නාගරික සංවර්ධන අධිකාරිය මඟින් නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ රාජ්‍ය ප්‍රතිපත්තිමය තීරණයක් මත කොළඹ නගර සංවර්ධනය කිරීමේ මූලික අරමුණ මත පැමිණිලිකාරිය පදිංචි ඉහත ලිපිනයෙහි නිවස සහ ඒ අවට අනෙකුත් නිවස් ඉවත් කිරීම හේතුවෙන් පැමිණිලිකාරියට ඡන්ද නාම ලේඛනය වෙනුවෙන් ලැබිය යුතු නියමිත ලකුණු ප්‍රමාණය ලැබී නොමැති බව පෙනේ. ඒ සඳහා පැමිණිලිකාරියට ලැබී ඇත්තේ, ලකුණු 18 ක් පමණි. මේ අනාවූ නිවාස සංවර්ධන අධිකාරිය නිසා පැමිණිලිකාරියට ලකුණු 12 ක ප්‍රමාණය අහිමිවීම හෙතුකොටගෙන තම දරුවා අදාළ වගඋත්තරකාර විද්‍යාලයට ඇතුළත් කිරීමට නොහැකි වී ඇති බවට නිරීක්ෂණය වේ.

3. ඒ අනුව දරුවන් පළමු වසරට ඇතුළත් කර ගැනීමේදී, පෙර පදිංචිව සිටි ස්ථානයේ ස්ථිර පදිංචිකරුවන්ගේ දරුවන් පාසලට ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් ඇති විය හැකි ගැටළු පිළිබඳව නිසි වැඩපිළවෙලක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් පැමිණිලිකරුට අසාධාරණයක් සිදුවී ඇති බව පැහැදිලි වේ. එය පැමිණිලිකාරියගේ පාලනය යටතේ පවතින කරුණක් නොවන අතර, මෙම කරුණු කෙරෙහි අවධානය යොමු කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේදී ඡන්ද නාම ලේඛනය සඳහා ලකුණු 30 ක් ලබා දීමේ හැකියාව තිබියදීත් එම ලකුණු ලබා නොදීම මත පැමිණිලිකාරියගේ දරුවාට වගඋත්තරකාර විද්‍යාලයට ඇතුළත් වීමට තිබූ අවස්ථාව අහිමි වී ඇති බවට මෙහිදී කරුණු අනාවරණය වේ.

නිගමනය :-

මෙම සමස්ත කරුණු අනුව වගඋත්තර පාර්ශවය විසින් අදාළ සම්මුඛ පරීක්ෂණයේදී නිසි කරුණු විමසීමකින් තොරව අත්තනෝමතික ක්‍රමවේදයක් අනුගමනය කිරීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට දී ඇති පැමිණිලි පාර්ශවීය මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව පැමිණිලිකාරියගේ දරුවා වන පී.එන්.එම් භාග්‍යානි සිසුවිය වගඋත්තරකාර කො/සංඝමිත්තා බාලිකා විද්‍යාලයේ (2018 වර්ෂයේ පළමු ශ්‍රේණියට) සමාන්තර ශ්‍රේණියට ඇතුළත් කරගැනීමට කටයුතු කළ යුතුය.

2021.03.01 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

| | |
|---|---|
| අනුසූයා ෂන්මුගනාදන්,<br>කොමසාරිස්,<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව. | මෑහේ. නිමල් කරුණාසිරි,<br>කොමසාරිස්,<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව. |
| Ms. Anus<br>Human Rights Commission | Dr. M.H. Nimal Karunasiri<br>Commissioner<br>Human Rights Commission of Sri Lanka |

පිටපත :- 01. ගරු අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල,

03. අධ්‍යක්ෂ (ජාතික පාසල්)
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/h